# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2355/19 – 2023 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා – 2023.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

අයි. එම්. උපාලි ජයලත් මයා, විල්ගම්දෙමටව, මලගනේ, වාරියපොල.

සහ

ටෝකියෝ සුපර් සිමෙන්ට් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 469 1/1, ගාලු පාර, කොළඹ 03

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කඳවල පාර අංක 55, නීතිඥ බිනර ඒ. ගුණසේකර මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2022/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අයි. එම්. උපාලි ජයලත් මයා, විල්ගම්දෙමටව, මලගනේ, වාරියපොල.

සහ

ටෝකියෝ සුපර් සිමෙන්ට් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 469 1/1, ගාලු පාර, කොළඹ 03

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ටෝකියෝ සුපර් සිමෙන්ට් කම්පැනි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ අයි. එම්. උපාලි ජයලත් මහතාට මූල්‍ය වංචා චෝදනා යටතේ සේවය අත්හිටුවා අධිකරණයෙහි නඩු පවරා දීර්ඝ නඩු විභාගයකින් පසුව සියළුම චෝදනාවලින් නිදෙස් කර නිදහස් කිරීමෙන් පසු නැවත ඔහුට එම ආයතනයේ රැකියාව ලබා නොදීම තුළින් යම් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0240

---

මගේ අංකය: IR/COM/03/2022/123.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ටී. එම්. ලංකාගේ මයා, 303, අගලෙගෙදර, වල්පිට.

සහ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, ''ජනවතු පියස'' ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26 එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2022/123.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ටී. එම්. ලංකාගේ මයා, 303, අගලෙගෙදර, වල්පිට.

සහ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, ''ජනවතු පියස'' ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පංතියේ සේවය කළ ටී. එම්. ලංකාගේ මහතා 1997 මාර්තු මස ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවයට අන්තර්ග්‍රහණය කර ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2020.06.02 දිනැති ලිපිය අනුව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියට 1993.07.01 දින සිට උසස් කර ඇත. ටී. එම්. ලංකාගේ මහතාට උක්ත උසස්වීම අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් කළ යුතු යාවත්කාලීන කරවීම නොකිරීම මගින් ටී. එම්. ලංකාගේ මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.